**ශීර්ෂය 022 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 022 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 අප්‍රේල් 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **මෙම වාර්තාවේ ඡේදයට යොමුව** |
|---|---|
| දේපල පිරියත හා උපකරණ | 1.6.1(ආ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය හා එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.36,757 ක වෙනසක් වූ අතර 2006 වර්ෂයටත් පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනා ගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ණය ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර පවතින රු.36,357ක වෙනස 2006 වර්ෂයටත් පෙර සිට පැවති වෙනසක් වන අතර, ඒ සම්බන්ධ ප්‍රමාණවත් දත්ත නොමැති කමින් මෙම වර්ෂයේදීද එය නිරවුල් කර ගැනීමට නොහැකි විය.මේ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ අතර ඉදිරියේදී එය නිරවුල් කරගැනීමට පියවර ගනු ලබයි. | වෙනස හඳුනා ගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය . |

(ආ) **දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව පරිගණක උපකරණවල වර්ෂය අවසානයේ ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය භාණ්ඩාගාර පොත්වල හා දෙපාර්තමේන්තු පොත්වල රු.1,130,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල,පිරියත හා උපකරණ ශේෂය සහ දේපල, පිරියත හා උපකරණ සංචිතයේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විනි. | සිගාස් වැඩසටහනෙහි සිදුවී තිබූ දෝෂයක් හේතුවෙන් එසේ ඉකුත් වර්ෂය අවසානයේ පැවති පරිගණක උපකරණ ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ලැබී නොතිබුණි. පසුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ගොස් එය නිවැරදි කරගන්නා ලදි. ඒ වන විට 2023 වර්ෂයේ අවසන් භාණ්ඩාගාර වාර්තා සකස්කර තිබූ බැවින් 2023 වර්ෂය සඳහා නිවැරදි ශේෂය ඇතුළත් කර ගැනීමට නොහැකි විය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිවැරදිව අගයන් ඇතුළත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 50 ට අනුව හැකිතාත් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු. 25,768,363 ක් හෙවත් සියයට 46 ක් හා රු.129,500 ක් හෙවත් සියයට 43 ක් ඉතිරිව තිබුණි. | අප විසින් ඇස්තමේන්තු කර අයවැය දෙපාර්තමේන්තුව වෙත යවන ලද වාර්තාවේ සඳහන් ආකාරයට මුළු ඇස්තමේන්තුව රු.30,655,000 ක් පමණක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව තක්සේරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුද්ගල පඩිනඩි සඳහා ඇස්තමේන්තුගත වියදම පෙර වර්ෂයට සාපේක්ෂව 2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් සියයට 25 ක හා සියයට 70 ක වැඩිවීමක් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට ඇස්තමේන්තුගත මුදලින් රු.26,340,000 ක් හෙවත් සියයට 53 ක් ඉතිරිව තිබුණි. එම ඉතිරිවීමට හේතු ලෙස දක්වා තිබූ නිලධාරීන් ස්ථාන මාරුවීයාම /විශ්‍රාමයාම/ සේවය හැරයාම විගණනයට පිළිගත නොහැකි විය. | 2023 වර්ෂයේ පුද්ගල පඩිනඩි සඳහා, අප විසින් රු.13,980,000 ක් පමණක් ඇස්තමේන්තු කර අයවැය දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඇ) | දේශීය ගමන් වියදම් සඳහා ඇස්තමේන්තුගත වියදම පෙර වර්ෂයට සාපේක්ෂව 2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් සියයට 29 ක් හා සියයට 100 ක වැඩිවීමක් වූ නමුත් වියදම් නිවැරදිව පුරෝකථනය කර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඇස්තමේන්තුගත මුදලින් රු.137,641 ක් හෙවත් සියයට 75 ක් ඉතිරිවී තිබුණි. | දේශීය ගමන් වියදම් සඳහාද රු.110,000 ක් පමණක් ඇස්තමේන්තු කර අයවැය දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඈ) | අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 13 ක රු.48,976,800 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 82 ක පරාසයක ප්‍රතිපාදන ඉතිරියක් වූ අතර වැය විෂයයන් 02 ක රු. 60,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. මූලධන වැය විෂයයන් 02 ක රු.300,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 ක් හා සියයට 42 ක් ඉතිරි වී තිබුණි. | ගිවිසුම අනුව ගොඩනැගිලි අයිතිකරු විසින් සිදු නොකරන ආකාරයේ නඩත්තු කටයුතු වර්ෂය තුළ ඇති නොවීම, නිල වාහනය භාවිතා කළ නිසා කොමසාරිස්තුමා හට වර්ෂය තුළ ප්‍රවාහන දීමනාව ලබාගැනීමට අවශ්‍ය නොවීම සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය වුවද, එම මුද්‍රණ යන්ත්‍රවල මිල ඉහළ යාම නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ප්‍රසම්පාදනය සිදු නොකළ අතර, වෙනත් මිලදී ගැනීම් සඳහා අවශ්‍යතාවයක් නොවූයෙන්, ප්‍රතිපාදන ඉතිරි විණි. එසේම නිලධාරීන්ගේ පුරප්පාඩු සහ සිටින සීමිත නිළධාරීන්ගේ අවශ්‍යතාවය මත පමණක් පුහුණුවීම්වල යෙදවීම නිසා එම ප්‍රතිපාදන ඉතිරි විය. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදම් ලෙස 2024 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ඇතුළත් නොවූ 2023 වර්ෂයට අදාල රු.19,605 ක බැරකමක්, 2024 වර්ෂයේ දී ගෙවා තිබුණි. | අදාළ වැය විෂයයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණයට පමණක් එසේ බැරකම ඇතුළත් කෙරිණි. එසේ ප්‍රතිපාදන අවසන් වූ වියදම් සඳහා මු.රෙ. 115 යටතේ අනුමැතිය ලබා ගන්නා ලදි . | වර්ෂයට අදාල සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මුදල් රෙගුලාසි 260 හා 264 | 170,320 | සෑම ගෙවීමකදීම වවුචරයේ නම සඳහන් පුද්ගලයා විසින් අදාල මුදල ලබාගත් බවට තහවුරුවක් ලබාගත යුතුවුවත් එවැනි තහවුරුවක් ලබා නොගෙන වවුචර්පත් 5ක් සඳහා ගෙවීම් කර තිබුණි. | අතපසුවීමකින් වවුචර්පත් 5 කට ගෙවීම් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල මුදල ලබාගත් බවට තහවුරුවක් ලබාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ජනවාරි 01 දින වනවිට පරීක්ෂණ පැවැත්වීමට හා වාර්තා කිරීමට නියමිත පසුගිය වර්ෂයෙන් ඉතිරි වී තිබූ පැමිණිලි 699 ක් ද, සමාලෝචිත වර්ෂය තුල ආයතනයට ලද ආයතනයේ බලතල යටතට ගැනෙන පැමිණිලි 978 ක් ද ලෙස වර්ෂය තුළ පරීක්ෂා කිරීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 1,677 ක් විය. එයින් වර්ෂය තුල පැමිණිලි 762 ක් සම්බන්ධයෙන් කටයුතු සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැමිණිලි 915 ක් පරීක්ෂණ පැවැත්වීමට හා වාර්තා කිරීමට තව දුරටත් ඉතිරිව තිබුණි. | පෙර වර්ෂයට සාපේක්ෂව මේ වර්ෂයේදි වැඩි පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති අතර, එම ගණන 1537ක් වේ. නමුත් ඒ අතරින් පැමිණිලි 559 ක්ම අපගේ බලතල යටතට අයත් නොවන බැවින් මෙම වර්ෂයේදි එම පැමිණිලි සංඛ්‍යාව සංඛ්‍යානමය විශ්ලේෂණයට ඇතුලත් නොකිරීමට තීරණය කරන ලදි. | පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 32 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 13 ක් එනම්, අනුමත සේවක සංඛ්‍යාවෙන් සියය 41 ක් විය. එසේම කාර්යාලයේ පරිපාලන නිලධාරී (පැමිණිලි) තනතුර වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | කාර්යාලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් දිගින් දිගටම ඉල්ලීම් කර ඇතිමුත්, මේ වනතෙක් එම පුරප්පාඩු සම්පූර්ණකර නොමැත. ස්ථාන මාරුවීම් යටතේ අනුප්‍රාප්තිකයින් ලෙස කාර්යාලයට නිලධාරින් පැමිණියද වසර 05 කට අධික කාලයක සිට පුරප්පාඩු කිසිවක් පිරවීමට පියවර ගෙන නොමැත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතු වේ. |